## යශෝදරාවන්ගේ හදින්

සැරසී සූසැට අභරණින් ....

පැළඳ ඔටුණු රූ ශ්‍රීයෙන්...

ඔපව වටිනා මැණික් වලින්

අඟනා උරමඩල් දිලෙමින්

පෙර දවස රන් රියක නැගී

මහා පෙලහරින් වඩින සඳ

මතකයි තේජසින් බැබලුනා ඔබ හිමියනි....

කෙස් රැවුල් ගා දමා අද - වසා කසාවතින් සිරුර

පාත්‍රය අතින් ගෙන ගෙයින් ගෙට  පිඩු සිඟාලන වග

කණ වැකුනදා පටන් මසිතට

එය නොහොබිදෝයි නැද්දොයි

වග ඔබට හිමියනි

දෑසින් දැක ගන්නට කියා - මහා මැදුරු කවුළු හැර බැලු සඳ

මේ නුවර රාජ්‍යශ්‍රීය හැර - ඔබ යන්න ගිය වග

විදිරාජ්‍ය  ශ්‍රීයට වඩා - ඔබේ පිඩු සිගාලන රාජ්‍ය

ඔබහට රුචිම බව..

ශ්‍රී විජරාමනය වඩන

ස්වාමීදරුවන් වහන්සේ දැක

සිතුණි මට...

අහෝ කොතරම් මනරම්ද

 ෂඩ් වර්ණයෙන් දිදුලන

මුලු ලොවක්-  නිර්වාණ සුවයෙන් හොඹවන

බුද්ධත්වයෙන් ඔබ ලද- ආශ්චර්යවත් දේහය

මොනතරම් මනරම්ද අගනේද?

අහෝ මේ දසුන ...

මේ මහා විශ්වයටම !

මංගලා කලන්සූරිය

## අපේ විලාසිතා

අදින් ඇරඹෙන මෙම විශේෂාංගය යටතේ සාරි විලාසිතා කිහිපයක් ඉදිරිපත් කෙරේ. ඔබගේ විලාසිතා සහිත ඡායාරූප මෙහි පලකරවා ගත හැක.ඒ සඳහා ඔබගේ නම ලිපිනය සහ දුරකථන අංකය සමග ඡායාරූප අපගේ ලිපිනයට යොමු කරන්න.



තම මංගල දිනයේදී ක්‍රිශාණි සහ තම යෙහෙළියන්ගේ සාරි විලාසිතා මෙහි දැක්වෙයි.



රෝහිනී සහ ඇගේ දියණිය මදාරා සමාන වර්ණ සාරි තෝරාගෙන තිබේ.